විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. } විවැ/චක්‍රලේඛ/2012   දිනය / திகதி / Date } 2012-02-29

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/ 2012**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,
ත්‍රිවිධ හමුදාපතිවරුන් වෙත.

**වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය පලකිරීම/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම/ සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමේ කාල සීමාව දීර්ඝ කිරීම**

01. වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය පලකිරීම

1983- 08- 01 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්කරනු ලැබූ එදිනට සේවයේ නියුක්තව සිටි රාජ්‍ය නිලධාරිණියන් හට වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට ඇතුලත් වීමේ මනාපය පලකිරීමේ කාලය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/ 2010 මඟින් 2010- 06- 30 දක්වා දීර්ඝකර තිබුණි.

එහෙත් එම කාලය තුළ මනාපය පලකිරීමට නොහැකි වූ නිලධාරිණියන් සඳහා මනාපය පලකිරීමේ කාලය අංක 1743/ 28 හා 2012- 02- 03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2012- 12- 31 දින දක්වා දීර්ඝකර ඇති බව මෙයින් දන්වමි.

ඒ අනුව පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

i. 1983- 08- 01 දිනට රාජ්‍ය සේවයේ සේවා නියුක්ත වූ නිලධාරිණියක් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනකට පෙරද එම දිනය 2012- 12- 31 ලෙසද,

ii. නිලධාරිණිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් සහ පොළිය එකවර ගෙවිය යුතු බවද,

| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

iii තවද, නිලධාරිණිය මියගොස් ඇත්නම් අදාල දායක මුදල සහ පොළිය ප්‍රදානයෙන් එකවර අඩුකළ යුතු බවත්, නිලධාරිණිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොළිය අය කළ යුතු බවද,

iv දායක මුදල් අයකිරීම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2008 අනුකූල විය යුතු බවද නියම කරමි.

v. තවද මෙම නියමයන් ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ඇති තැනැත්තියන්ට පමණක් සීමාවන බව වැඩිදුරටත් නියම කරමි.

පහත සඳහන් තැනැත්තන්ට මෙම මනාපය පලකළ හැක.

1. දැනට සේවයේ යෙදී සිටින (1983- 08- 01 දිනට පෙර පත්වීම් ලැබූ) මනාපය පළ කිරීමට කැමති නිලධාරිණියන්.

2. දැනට විශ්‍රාම ලබා ඇති මනාපය පළ කිරීමට කැමති නිලධාරිණියන්.

3. මනාපය පළකිරීමට දී ඇති අවසාන දිනයට පෙර මියගොස් ඇති නිලධාරිණියන්. (මෙහිදී වැන්දඹු පුරුෂයා හෝ අනත්දරුවන් හෝ අනත්දරුවන්ගේ භාරකරුවන් ලවා PD1A ආකෘති පත්‍රය අත්සන් කළ හැකිය).

**02. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම**

2010 අංක 8 දරණ වැන්දඹු හා අනත්දරු අරමුදලේ (සංශෝධිත) පනත හා 2010 අංක 9 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් හි සඳහන් විධිවිධාන සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද 2010- 12- 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 කෙරේ අවධානය යොමු කරවමි. එහි සඳහන් 2010 අගෝස්තු 17 දිනට පෙර අදාල සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම්පෑමේ දිනය 2012- 12- 31 දින දක්වා දීර්ඝකොට ඇත. එම චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධාන එපරිද්දෙන් ක්‍රියාත්මක වේ.

**03. සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම**

යුධ ගුවන් හා නාවික හමුදාවන්හි ස්වේච්ඡා බලකාය, නිත්‍ය උපසේවා සහ ස්වේච්ඡා උපසේවා බලකායන්හි සාමාජික/ සාමාජිකාවන් හට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රතිලාභ ලබා දීම සඳහා මවිසින් නිකුත් කරන ලද 2009- 05- 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/ 2009 කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි. 1981- 09- 01 දිනට පෙර පත්වීම්

ලබා එදිනට සේවයේ යෙදී සිටි යම් සාමාජිකයෙක් වෙතොත් ඔහුටද, කලත්‍රයාටද, අනත්දරුවන් හෝ අනත්දරු භාරකරුටද මනාපය පලකළ හැකි අතර, එමෙන්ම 1983-08-01 දිනට පෙර පත්වීම් ලබා එදිනට සේවයේ යෙදී සිටි යම් සාමාජිකාවක් වෙතොත් ඇයටද, කලත්‍රයාටද, අනත්දරුවන් හෝ අනත්දරු භාරකරුටද මනාපය පලකල හැකි අතර, මෙම මනාපයන් පලකල හැකි අවසාන දිනය 2012-12-31 දින ලෙස මින් නියම කරමි.

එකී චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සියළු විධිවිධානයන් එපරිද්දෙන් ක්‍රියාත්මක වේ.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව
5. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. ලේකම් - මුදල් අමාත්‍යාංශය
9. විගණකාධිපති